# පුරාවිද්‍යාව හා මහජන සම්බන්ධතාවය

ඩී.එච්. යෂිකා නයෝමි[1]

පුරාවිද්‍යාව හා මහජන සම්බන්ධතාවය කාලීන වශයෙන් ඉතා වැදගත් වේ. මේ පිළිබඳව ප්‍රථමයෙන්ම අදහස් ඉදිරිපත් කරන ලද්දේ චාර්ල්ස් මැක්ගිම්සේ විසිනි. මොහු මෙහි දී, පුරාවිද්‍යා වෘත්තීයවේදීන්, නීති සම්පාදකයන්, සාමාන්‍ය ජනතාව ලෙස මහජනතාව වර්ග කරමින් අවධානය යොමු කරයි. හුදෙක්ම පුරාවේදීන් නොවන සාමාන්‍ය ජනතාව වෙත තොරතුරු සම්ප්‍රේෂණය කිරීම පුරාවිද්‍යාව හා මහජන සම්බන්ධතාවයේ අරමුණ බව මොහු අවධාරණය කරයි. පර්යේෂණයේ අරමුණු කිහිපයක් කෙරෙහි පර්යේෂකයාගේ අවධානය යොමු විය. එහි දී මහජනතාව තමන්ගේ උරුමයන් සම්බන්ධයෙන් අවදි කිරීම හා සජීවීව බැඳ තබා ගැනීම, අභිප්‍රේරණය ඇති කිරීම, ආචාරධර්ම හඳුන්වා දීම ආදිය මෙහි අරමුණු වශයෙන් පෙන්වාදිය හැකි අතර තම අතීත උරුමයන් පිළිබඳව මනා අවධානයක්, කැමැත්තක්, සබැඳියාවක් ජනයා තුළ ඇති කරවීමත්, පුරා භූමි පිළිබඳව ජනතාව තුළ දැනුවත්භාවයක් ඇති කරවීමත් ඒ හරහා පුරාවිද්‍යාව හා සම්බන්ධ ආචාරධර්ම කෙරෙහි යොමු කරවීමත් මෙහිලා අපේක්ෂා කෙරේ. පුරාවිද්‍යාව සහ මහජන සම්බන්ධතාවය වැදගත් වන්නේ ඇයි සහ පුරාවිද්‍යාව සහ මහජන සම්බන්ධතාවය කෙබඳු ද යන පර්යේෂණ ගැටලු කෙරෙහි මෙහි දී අවධානය යොමු විය. පුරාවිද්‍යාඥයකු විසින් අනාවරණය කරගනු ලබන දෑ දැනගැනීමට ජනතාවට අයිතියක් ඇත්තා සේම, පුරාවිද්‍යාඥයා විසින් තොරතුරු ජනයා වෙත සම්ප්‍රේෂණය කිරීම ද පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ වගකීමකි. එසේම එය පුරාවිද්‍යා ක්ෂේත්‍රයට වැදගත් වනුයේ පුරාවිද්‍යාව හුදෙකලා විෂයක් නොවන නිසාත්, අනාවරණය කරන ලද තොරතුරු, දත්තවල හෝ ද්‍රව්‍යවල සුරක්ෂිතභාවය රැඳී පවතිනුයේ ජනතාව අත නිසාත්ය. මහජන සම්බන්ධතා ක්‍රමවේද වශයෙන් ක්ෂේත්‍ර චාරිකා, ප්‍රදර්ශන හා වාර්තා කිරීම්, අත් පත්‍රිකා, පුවත්පත්, රූපවාහිනී වැඩසටහන්, ගුවන් විදුලි වැඩසටහන්, කෞතුකාගාර, සංචාරක උපදේශකයන් වැනි දේ සිදු කිරීම මගින් මහජන සබඳතාවය පවත්වා ගත හැකිය. මෙහි දී ප්‍රයෝගික භාවිතයේ දී, ක්ෂේත්‍රයේ දී මෙන්ම කෞතුකාගාර තුළ දී ද කැණීම්, ගවේෂණ, සංරක්ෂණ ආදී කටයුතුවල දී මහජන සබඳතාවය වැදගත් වන්නේ කෙසේ ද යන කරුණ පිළිබඳ අවධානය යොමු කෙරේ. විශේෂයෙන් කෞතුකාගාර තුළ දී ප්‍රේක්ෂකයා හඳුනාගැනීම, සේවය ලබාදෙන ආකාරය, මහජනතාව දැනුවත් කළ යුතු විශේෂ ක්‍රමවේද ආදිය හඳුනාගැනීමත් ඊට යෝග්‍ය පරිදි මහජන සම්බන්ධතා ක්‍රමවේදය වෙනස් කර නිර්මාණශීලි ක්‍රමවේද භාවිත කිරීම පිළිබඳ කරුණු අනාවරණය විය. පර්යේෂණයේ දී විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවල ක්‍රියාකාරිත්වය ද සාකච්ඡා කෙරේ. මෙකී පර්යේෂණය ක්‍රියාත්මක කිරීමේ දී විවිධ සීමා සහ ගැටලුවලට මුහුණ පෑමට සිදු වූ අතර ඒවා අවම කරගැනීමට කටයුතු කිරීම මඟින් ශක්තිමත් සම්බන්ධයක් මෙකී ප්‍රපංච ද්විත්වය අතර පවත්වාගෙන යාමට හැකියාව ලැබේ.

ප්‍රමුඛ පද : පුරාවිද්‍යාව, පුරාවිද්‍යාඥයා, මහජන සබඳතාවය, කැණීම්

[1] ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.yashikaiyomi1@gmail.com